රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.

இணைந்த சேவைகள் பிரிவு
சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை.

COMBINED SERVICES DIVISION
*Independence Square, Colombo 07, Sri Lanka*

දුරකථනය / தொலைபேசி: **(94) 011- 2694560** / Telephone
ෆැක්ස් / தொலைநகல்: **(94) 011- 2692254** / Fax
ඊ-මේල් / மின்னஞ்சல்: **dgcs@pubad.gov.lk** / E-mail
වෙබ් අඩවිය / இணைத்தளம்: **www.pubad.gov.lk** / Web Site

---

මගේ අංකය / எனது இல / My No: R/DO/PER.APP/2020
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2020.04.20

**<u>ඒකාබද්ධ සේවයට අයත් නවක පත්වීම්ලාභී නිලධාරීන් රාජකාරි භාර ගැනීම</u>**

i **<u>ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තිය III ශ්‍රේණිය සහ 2 පන්තිය II ශ්‍රේණිය - පත්වීම් දිනය 2020.03.16</u>**

ii **<u>සංවර්ධන නිලධාරි සේවයේ III ශ්‍රේණිය (2018 වසරේ බඳවාගත් උපාධිධාරී අභ්‍යාසලාභීන්) – පත්වීම් භාර ගැනීමේ අවසාන දිනය 2020.03.16</u>**

2020.03.16 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි මා විසින් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තිය III ශ්‍රේණිය සහ 2 පන්තිය II ශ්‍රේණියට පත් කළ නිලධාරීන් සහ 2020.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංවර්ධන නිලධාරි සේවයේ III ශ්‍රේණියට පත් කරන ලද නිලධාරීන් බහුතරයකට දැනට රට තුළ උද්ගතව ඇති තත්ත්වය හේතුවෙන් මෙතෙක් රාජකාරි භාර ගැනීමට නොහැකි වී ඇත. එසේම දිස්ත්‍රික්ක බොහෝමයක ඇඳිරි නීති විධිවිධාන ලිහිල් කළ ද රාජ්‍ය ආයතන සඳහා නිලධාරීන් කැඳවීමට හැකි වන්නේ ජනාධිපති ලේකම්ගේ PS/GPA/චක්‍ර ලේඛ/20/2020 සහ 2020.04.18 දිනැති ලිපිය මගින් ලද උපදෙස් අනුව සීමිත ප්‍රමාණයක් පමණි.

02. එබැවින් ආයතන ප්‍රධානීන් වෙතින් විශේෂ කැඳවීමක් නොලදහොත් ඉහත රාජකාරි භාර නොගත් නිලධාරීන් මේ අවස්ථාවේ දී රාජකාරි භාර ගැනීමට කටයුතු නොකරන මෙන් කාරුණිකව දන්වා සිටිමි. එසේම රාජකාරි භාර ගැනීම සඳහා ඉහත නිලධාරීන්ට ලබා දෙන කාලය **2020.05.04** දින දක්වා දීර්ඝ කරන බව ද දන්වා සිටිමි.

03. ඒ අනුව දැනට රජය විසින් පනවා ඇති පුද්ගල සංචරණ සීමා කිරීම් සහ රාජ්‍ය ආයතනවල අත්‍යාවශ්‍ය සේවා පවත්වා ගැනීමට පමණක් සීමා වන පරිදි පනවා ඇති විධිවිධාන වලට බාධා වන පරිදි සේවා ස්ථාන සංශෝධන ඉල්ලීම් හෝ මේ සම්බන්ධ වෙනත් ලිඛිත ඉල්ලීම් රැගෙන මෙම අමාත්‍යාංශය වෙත පැමිණීමෙන් වළකින ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

04. නවක පත්වීම්ලාභී සංවර්ධන නිලධාරීන්ගේ ඉල්ලීම් මත සේවා ස්ථාන සංශෝධන සිදු කරන ලද අතර එම නිලධාරීන්ගේ නාමලේඛනය 2020.03.17 දිනැතිව අමාත්‍යාංශයීය වෙබ් අඩවියේ පළ කරන ලදී. ඒ අතුරින් මෙතෙක් සංශෝධන ලිපි ලබාගැනීමට නොහැකි වූ නිලධාරීන්ගේ ලිපි 2020.05.04 දිනට පෙර ලැබෙන සේ තැපැල් මගින් එවීමට කටයුතු කරන බව ද සැලකුව මැනවි. මේ වන විට පත්වීම් ලිපිය මගින් අනුයුක්ත කළ සේවා ස්ථානවල **<u>රාජකාරි භාර ගත් යම් නිලධාරියකු</u>** වෙත සේවා ස්ථාන සංශෝධන ලිපියක් නිකුත් වී ඇත්නම් එම ලිපිය බල රහිත වන අතර එම නිලධාරීන් සාමාන්‍ය ස්ථාන මාරු ක්‍රමවේදය අනුගමනය කරමින් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා හරහා ස්ථාන මාරුවක් අයැදුම් කළ යුතු වේ.

එස්. ආලෝකබණ්ඩාර
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්